# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 38 දරන ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2007 සැප්තැම්බර් මස 24 වන දින ]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 සැප්තැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 7.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2007 අංක 38 දරන ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 24 වන දින]

එල්. ඩී.— ඕ. අයි. එන්. සී. 9/2004

## ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන භාරයක් ඒ භාරයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබුන හෙයින් ද: පූර්විකාව.

එකී භාරය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ භාරකාර මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇති හෙයින් සහ ඉටුකර ඇති හෙයින් ද, ඒ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීමට ඉල්ලුම්කර ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 38 දරන ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන්පසු (මින්මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලයේ දැනට සාමාජිකයන් වී සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඒ සංස්ථාවට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකාවේ භගවාන් ශ්‍රී සත්‍ය සායි මධ්‍යම භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(i) භගවාන් ශ්‍රී සත්‍ය සායි බාබා තුමාගේ ඉගැන්වීම් සහ පණිවුඩය බෙදා හැරීම ;

(ii) භගවාන් ශ්‍රී සත්‍ය සායි බාබා විසින් ස්ථාපිත සත්‍ය, ධර්මය, ශාන්තිය, ප්‍රේමය සහ අහිංසාව යන මේ මූලික මූලධර්ම පරිචයෙන් හා ආදර්ශයෙන් ප්‍රවර්ධනය කිරීම ;

(iii) වේද, උපනිෂද්, ශාස්ත්‍ර, පුරාණ සහ සනාථන ධර්මයට අයත් සෙසු සාහිත්‍යය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම ;

(iv) ලෝකයේ සියලුම ප්‍රධාන ආගම්වල ශ්‍රේෂ්ඨ, උත්කෘෂ්ට හා උත්තරීතර ආචාර ධර්ම ඇතුළත් මූලධර්ම සහ එවැනි ආගම්වල සත්‍ය පදනම වන්නාවූ අධ්‍යාත්මික භාවය පිළිබඳ අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම ;

(v) ආගම් අතර සමගිය ප්‍රවර්ධනය කිරීම ;

(vi) මනුෂ්‍ය වර්ගයා අතර සාමය සහ සුහද බව ප්‍රවර්ධනය කිරීම ;

(vii) ඕනෑම පාසලක, විද්‍යාලයක, විශ්ව විද්‍යාලයක හෝ භාරය විසින් අනුමත වෙනත් ආයතනයක අධ්‍යාපනය හැදෑරීමට සුදුසු ශිෂ්‍යයනට ශිෂ්‍යත්ව ලබාදීම ;

(viii) ආධාර අවශ්‍ය දුප්පත් ශිෂ්‍යයන්ට පොත්, උපකරණ, ඇඳුම් පැළඳුම්, ණය මුදල් හා මූල්‍යමය ප්‍රතිපාදන සපයා දීමෙන් සහාය දැක්වීම ;

(ix) අධ්‍යාපනය වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කෙරෙන පන්ති, දේශන, සම්මන්ත්‍රණ සහ අධ්‍යයන චාරිකා පැවැත්වීම සහ ඊට අදාළ වෙනත් කටයුතුවල නිරතවීම ;

(x) දිළිඳු, මහලු සහ ආබාධිත අයට සහ අනාථ ළමයිනට නිවාස සැපයීම ;

(xi) ආපදාවන්ට පත්ව සිටින පුද්ගලයන්ට වියළි ආහාර, කෑම, ඇඳුම් සහ වෙනත් ආධාර සැපයීම ;

(xii) රෝගී පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සඳහා ආරෝග්‍යශාලා සහ සායන ඉදි කිරීම, ස්ථාපනය කිරීම හා සැපයීම ;

(xiii) රෝගී පුද්ගලයන්ට ඖෂධ සහ වෛද්‍ය ප්‍රතිකාර සැපයීම ;

(xiv) සෞඛ්‍යය, සමාජ සුභසාධනය සහ සමාජ පුනරුත්ථාපනය ප්‍රවර්ධනය කිරීමටත්, රෝග බෝවීම වළකාලීමටත් තුඩුදෙන ප්‍රදර්ශන පැවැත්වීම සහ ඊට අදාළ වෙනත් කටයුතුවල නිරත වීම ;සහ

(xv) ශ්‍රී ලංකාවේ ශ්‍රී සත්‍ය සායි සංවිධානයේ වෙනත් භාර විසින් දැනටමත් පවත්වාගෙන යනු ලබන හෝ මින් මතුවට සංවිධානය කරනු ලැබිය හැකි වැඩ කටයුතු අවශ්‍ය පරිදි සම්බන්ධීකරණය කිරීම හා මෙහෙය වීම.

4. (1) සංස්ථාවේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය— භාරකාර මණ්ඩලයේ සංයුතිය.

(අ) සංස්ථාවේ සභාපතිවරයාගෙන් ;

(ආ) සංස්ථාවේ මහලේකම්වරයාගෙන් ; සහ

(ඇ) සංස්ථාවේ භාණ්ඩාගාරිකවරයාගෙන්,

සමන්විත, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත වන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පළමුවන භාරකාර මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ භාරයේ භාරකාර මණ්ඩලය විය යුතු අතර, එම භාරකාර මණ්ඩලය, සංස්ථාවේ රීතිවලට අනුකූලව නව භාරකාර මණ්ඩලයක් තෝරා පත් කර ගන්නා තුරු ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු පහත දැක්වෙන බලතල සංස්ථාවට තිබිය යුතු ය :—

(අ) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් මුදලින් හෝ අන්‍යාකාරයකින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග නැතහොත් සහනාධාර ලබා ගැනීම හෝ රැස් කිරීම ;

(ආ) චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීම සහ එවැනි දේපළක් දැරීම, තබා ගැනීම හෝ බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රදාන, පරිත්‍යාග හෝ ණය ලබා දීම ;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සහ චෙක්පත්, පොරොන්දු නෝට්ටු, විනිමය බිල්පත් සහ ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර ලිවීම, සකස් කිරීම, භාර ගැනීම, පිටසන් කිරීම සහ ගනුදෙනු කිරීම ;

(ඉ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියම සහ කොන්දේසි මත සහ එසේ තීරණය කරනු ලබන පාරිශ්‍රමික අනුව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ;

(ඊ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සුරැකුම්පත්වල සංස්ථාවට අයත් අරමුදල් ආයෝජනය කිරීම ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාව විසින් කලින් කළ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමකදී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුරකාලය, එම සාමාජිකයන් ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම, පුරප්පාඩු පිරවීම සහ එම සාමාජිකයන් තෝරා පත් කර ගැනීම ;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ සේවය පිළිබඳ නියම සහ කොන්දේසි ඇතුළුව ඔවුන්ගේ බලතල, වැඩ කටයුතු, කාර්යය සහ කර්තව්‍ය ;

(ඇ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ එහි ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කළ යුතු ආකාරය;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය, එහි අරමුදල්වල භාරකාරත්වය ;සහ

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් යම් දේ කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම සංස්ථාවේ යම් රීතියක් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු ම සාමාජිකයන් තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්විය යුතු ය.

7. (1) (මෙහි මින් මතු "භාර අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවේ අරමුදල— සංස්ථාවේ අරමුදල.

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ බැරට තිබූ සියලු මුදල්වලින් ;සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව සංස්ථාවට උපචිත විය හැකි සියලු මුදල්වලින්,

සමන්විත විය යුතු ය.

(2) භාර අරමුදලේ බැරට ඇති සියලු මුදල් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමේ දී දරනු ලබන වියදම් පියවීම සඳහා යොදා ගත යුතු ය.

ගිණුම් විගණනය.

**8**. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ සියලු ආදායම් සහ වියදම් පිළිබඳව ද, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව යථා පරිදි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සංස්ථාව විසින් පත්කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වර්ෂයකට වරක්වත් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක සන්තකය දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

භාරයට අයවිය යුතු හෝ භාරය විසින් ගෙවිය යුතු ණය.

**9**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති භාරයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එම දිනයේ දී භාරයට අය විය යුතු සහ ගෙවිය යුතු සියලු ණය සහ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

10. සංස්ථාවේ මුද්‍රාව— සංස්ථාවේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන තැනැත්තන්ගේ භාරයේ තැබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; සහ

(ඇ) මණ්ඩලයේ අවසරය ඇතිව මිස, සහ අවම වශයෙන් මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු පැමිණ සිටී නම් මිස, කවර වූ හෝ සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු ය. තව ද, එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

11. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.